#mediaethicsSL #SinhalaPress #lka #Mawbima
යම්කිසි ප්‍රවෘත්තියක් පළ කිරීමේදී, එය නිවැරදි පුවතක්ද යන්න සොයා බැලීම සඳහා ජනමාධ්‍යයක් විසින් සෑම සියලු සාධාරණ උත්සාහයක්ම දැරිය යුතු වෙයි. කෙසේ වුවත් එවන් උත්සාහයකින් පසුව වුවද එවන් පුවතක් නිරවද්‍ය නොවන වගට කරුණු හෙළිවීමේ ඉඩක් ඇති බවද අපට පිළිගැනීමට සිදුවේ. එවන් විටක වහාම සිදුකළ යුතු ආචාර ධාර්මික කාර්‍යය වන්නේ, එම මුල් ප්‍රවෘත්තිය සඳහන් වූ ඉඩට හා ප්‍රමුඛතාවයට සමාන ඉඩකින් හා ප්‍රමුඛතාවයකින් යුතුව නිවැරදි කිරීම පළ කිරීමයි.

පසුගිය දින මව්බිම මුල් පිටුවේ "ඔක්තෝබර් 26 වගේ වැඩක් යළි වුණොත් මම ගෙදර යනවා" යන මැයෙන් යුතුව පළවූ පුවතෙන් කියැවුණේ, එය කථානායකවරයා විසින් සිය සමීපතමයන් සමග පවසා ඇති බවට 'විශ්වාස කටයුතු ආරංචි මාර්ග' ඔස්සේ දැනගැනීමට ලැබුණු බවයි!

කෙසේ නමුත් ඉන් අනතුරුව කථානායක කාර්‍යාලයේ මාධ්‍ය අංශය මගින් නිකුත් කළ ප්‍රවෘත්ති නිවේදනයකින් දැක්වූයේ පුවත්පතේ සඳහන් වූ එම ප්‍රකාශය සාවද්‍ය බවත්, එම පුවත නිසි මූලාශ්‍රයක් පදනම් කර නොගනිමින් පළව ඇති බවත් වේ. එම පුවත අදාළ මාධ්‍ය ආයතනයේ අනුමානයක් පමණක් යැයි පෙනී යන බවද එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන් විණි. එම නිවේදනය ප්‍රකාරව මව්බිම පුවත්පත මගින් ඉන් පසු දිනයේදී මුල් පිටුවේම එම මුල් පුවත සාවද්‍ය වන බවට කථානායක මාධ්‍ය ඒකකය උපුටා දක්වමින් ප්‍රවෘත්තියක් පළ කරන්නට යෙදිණි.

මෙහිදී අපගේ අවධානය යොමු විය යුතු කරුණු කිහිපයකි. මූලාශ්‍රයන් සඳහන් නොකරමින් ප්‍රවෘත්තියක් පළ කළ යුත්තේ, එම මූලාශ්‍රය ආරක්ෂා කිරීමේ අරමුණ වෙනුවෙන් පමණක්ම බව අප මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. මන්දයත්, සාවද්‍ය තොරතුරු ජනගත කිරීමට පවා මූලාශ්‍ර නොමැති පුවත් ඔස්සේ හැකියාව ඇති බැවිනි. කථානායක මාධ්‍ය නිවේදනයද එවන් යමක් මෙහිදී සිදුවී ඇති බවට ඉඟි කර සිටී. කෙසේ හෝ මුල් ප්‍රවෘත්තිය 'විශ්වාස වන්ත ආරංචි මාර්ගයක්' ඔස්සේම ලැබී ප්‍රකාශ කෙරුණේ යැයි සිතමු. එවිට කථානායක මාධ්‍ය ඒකකයෙන් එය සාවද්‍ය බවට නිවේදනයක් නිකුත් කළ විට, එම මුල් පුවතට සමාන ඉඩක් හා ප්‍රමුඛතාවක් ඇතිව එම මුල් පුවත වැරදි බව පළ කිරීමද ප්‍රශංසා කටයුතු වෙයි. එනමුත් මෙහිදී මබ්විම පුවත්පත මගින් පළමු ප්‍රවෘත්තිය සාවද්‍ය බවට තමන්ගේ පාර්ශවයෙන් කියා සිටීමක් සහ/හෝ ඒ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කිරීමක් සිදුකර නොමැත. එවිට එය සැබවින්ම නිවැරදි කිරීමක් ලෙසින් ගණන් ගැනීමට හැකිද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?